# වකයමාවේ ජීවිතය

පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මස විසිහතර වන දින මම වකයමාවට පැමිණියෙමි.වකයමාවට පැමිණ මාස අටක් පමණ ඉකුත් විය .ලංකාවේ සිටින කාලය අතරතුර ජපානයේ වකයම ප්‍රදේශය පිලිබඳ කොහෙත්ම දැන නොසිටියෙමි.කන්සයි ගුවන් තොටුපලේ සිට බසයෙන් පැමිණ විශ්වවිද්‍යාලයේ අපව භාරව සිටි කාර්යාල සේවිකාවත් සමඟ කාරයට නැග පැමිණෙන විට රෑ බෝ වී තිබුණි.නමුත් වටපිට බලන විට බොහොම ලස්සන සහ නිසංසල පරිසරයක් විය.ඈත කන්ද මුදුනෙහි අලංකාරව දිස් වන විශාල ගොඩනැගිල්ල මාගේ අවුරුද්දක නවාතැන්පල යැයි මියසව මෙනවියගෙන් දැනගත් විට මහත් ප්‍රීතියක් දැනුණි.

"වකයම කොහොම තැනක් ද,වකයමහි මිනිසුන් කෙබඳු ද"යැයි මගේ සිතේ හොල්මන් කල ප්‍රශ්න කෙමෙන් කෙමෙන් විසඳෙන්නට විය.විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයේ සහය ඇතිව නගර කාර්යාලයට ,බැංකුවට ගිය විට ජපන් ජාතිකයින් බොහොම කරුණාවෙන් සලකන්නට විය.අසූ සේම ඔවුන්ගේ විනය ගරුක බව පැසසුම් සහගතය.ජපානයට පැමිණි පසු දිනම ජපානය පිළිබඳව හොඳ ආකල්පයක් සිත්හි තැන්පත් විය.දින දෙකක් වත් ගත නොවූ නමුදු පාපැදියක් ද ලැබුණි.මාත් සමඟම පැමිණ සිටි අනෙක් සත් දෙනාම ගැහැණු ළමුන් වුවත් හොඳ මිතුරන් බවට පත් විය.තව ද මාත් සමඟ වාසය කරන ජපන් ජාතික මිතුරන් දෙදෙනා ද බොහොම කරුණාවන්ත විය. මා හට වටහා ගැනීමට අපහසු අධ්‍යාපනික වැඩ නිවසෙහි කටයුතු ද ජපන් සමාජය පිළිබඳව ද විවිධ දෑ ඔවුන්ගෙන් ඉගෙන ගත්තෙමි.ආපන ශාලාවට ගිය විට අහාර අසාත්මිකතා හේතුවෙන් කෑමට නොහැකි දෑ තිබූ විට එහි සේවකයින් "ටිකක් ඉන්න" යැයි කියා වෙනත් කෑමක් සාදා දුන්නේය.නොදන්නා ස්ථානයක් පිළිබඳව යමෙකුගෙන් අසූ විට "එහෙනම් එකට යමු ද?"යැයි පවසා මඟ පෙන්නුවේය.විශ්වවිද්‍යාලයේ ගුරුවරුන් ද ජාත්‍යන්තර සම්බන්ධතා ඒකකයේ සියළු දෙනාම විවිධ අයුරින් උදව් කරන්නට විය.ලංකාවේ සිට එකට පැමිණි අනෙක් මිතුරියන් පස් දෙනා ජපානයේ තවත් විශ්වවිද්‍යාලයන් පහක අධ්‍යාපනයේ නිරත වෙමින් සිටිති.ඒ ප්‍රදේශයන්හි නොමැති විශේෂ සංවිධානයක් වකයමහි ඇත. "වින්ග්කොන් කෝඩ්" නම් වූ සංවිධානයේ නකතනි මහත්මිය ප්‍රමුක කැපකරු මා පිය හා ස්වේච්ඡා ගුරුවරුන් විදේශ ශිෂ්‍යයන් වූ අප හට විවිධ අයුරින් උදවු කරමින් සිටි.නිදසුනක් ලෙස ඔවුන්ගේ නිවසෙහි සාදයක් තිබුන ද ආරාධනා කරයි.අසනීප වූ විට පවුලේ අය වෙනුවට "වින්ග්"හි "තමුරා"මහත්මිය විවිධ අයුරින් උපකාර කළා ය.මේ ආකාරයෙන් කරුණාවන්ත පිරිසක් සිටින වකයමාවට පැමිණීමට ලැබීම මා ලැබූ වාසනාවක් යැයි සිතූ වාර අපමණ ය.

ජපානයට පැමිණීමට පෙර වකයමාව පිලිබඳ දැන සිටියේ එක් කරුණක් පමණි.එය වකයමාහි දොඩම් ජපානයේ පළමු තැන ගන්නා බව ය.නමුත් වකයමාවට පැමිණි පසු වකයමාව පිලිබඳ විවිධ දෑ දැනගන්නට ලැබුණි.දොඩම් පමණක් නොව "උමෙ බොෂි", "රාමෙන්" ආදියට ද වකයමාව ප්‍රසිද්ධ බව ය.එමෙන්ම ඓතිහසිකවම ද වකයමාව ජපානයේ වැදගත් ස්ථානකි. "කෝය සන්", "කුමනො කොදො" ආදී ලෝක උරුම පවතී.තව ද "කද", "ශිරහම", "ශිරසකි මුහුදු වෙරළ" ආදී සුන්දර වටපිටාවක් සහිත සංචාරක ස්ථාන ද ඇත. "අවශිම ජින්ජා" ආදී ප්‍රසිද්ධ පූජනීය ස්ථාන බොහොමයක් තිබෙන අතර "වක මත්සුරි", "නචිනො හි මත්සුරි", "බුන්දර ඔදොරි" ආදී සම්ප්‍රධායික උත්සව පවත්වයි.එමෙන්ම වසන්ත කාලය එළඹෙත් ම සකුරා මලින් ගහනව සුන්දර වන වකයම මාළිගය සැබවින් ම වකයමාවෙහි ජනප්‍රිය ස්ථානයක් වෙයි.ගෙවූ මාස අට තුළ වකයමාවෙහි විවිධ තැන් නැරබීමට ගියෙමි.උත්සව වලට සහභාගී වුණෙමි.මහත් ප්‍රීතියක් ලද්දෙමි.

ජපන් පුරාණ සාහිත්‍යයෙහි ද කියවෙන වකයමාව ඓතිහසිකවම ද වැදහත් ස්ථානයකි.සුන්දර ස්ථානයන් බොහොමයක් පවතී.නමුත් ජපානයේ වෙනත් ප්‍රදේශයන් හි ජීවත් වන ජපන් ජාතිකයන් පවා මෙම ස්ථානයන් පිලිබඳව නොදනී.එබැවින් එවැනි තැන් රට තුළ පමණක් නොව ජාත්‍යන්තරයට ද හඳුන්වා දෙන්නේ නම් කෙසේ ද?අවුරුද්දක ශිෂ්‍ය ජීවිතය අවසන් වී ලංකාවේ විශ්වවිද්‍යාලය සමත් වී නැවත ජපානයට පැමිණෙන්නේ නම් වකයමාවටම පැමිණීමට බලාපොරොත්තු වෙමි.

**ඉෂාර පැතුම් නුවන්සිරි**